මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| ඉතිහාසය | 6 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ......................................................................................................................

## I පත්‍රය

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- දී ඇති වරණ අතරින් නිවැරදි වරණය තෝරා ගෙන යටින් ඉරක් අඳින්න.

01. ඉතිහාසය ගැන අපට දැනුම ලබා ගැනීමට උපයෝගි වන සෑම දෙයක්ම හැඳින්වීමට යොදන පොදු නම,
    - i. පොත්පත්
    - ii. නටඹුන්
    - iii. මූලාශ්‍රය
    - iv. මෙවලම්

02. අපේ රටේ ඉතිහාසය ඉගෙන ගැනීමට ඇති පැරණිම මූලාශ්‍රය,
    - i. දීප වංසය
    - ii. මහාවංසය
    - iii. චූල වංසය
    - iv. නිකාය සංග්‍රහය

03. මහා වංසය රචනා කරන ලද හිමියන් කවුරුන්ද
    - i. දික්සඳ පිරිවෙන් වාසි මහානාම හිමි
    - ii. බුද්ධඝෝෂ හිමි
    - iii. ධර්මසේන හිමි
    - iv. ගුරුළුගෝමි පඬිවරයා

04. බුදුන් වහන්සේගේ උප්පත්තිය මුල් කරගෙන ආරම්භ වන වර්ෂ ක්‍රමය,
    - i. ක්‍රිස්තු වර්ෂ
    - ii. බුද්ධ වර්ෂ
    - iii. ශක වර්ෂ
    - iv. හිජ්රි වර්ෂ

05. පළමු වරට ගොඩබිම පහළ වූයේ,
    - i. සතුන් ය.
    - ii. ගස්වැල් ය.
    - iii. මැමත් අලින් ය.
    - iv. බැක්ටීරියාවන් ය.

06. මිනිසා විසින් පළමු වරට ගින්දර භාවිතා කිරීමේ සාක්ෂි ලැබුණු රට කුමක්ද?
    - i. චීනය
    - ii. ඊශ්‍රායලය
    - iii. ඉන්දියාව
    - iv. අරාබිය

07. වඩා සාරවත් දේ නිපද වූ මානවයා හැඳින්වූයේ,
    - i. හෝමෝ සාපියන්
    - ii. හෝමෝ ඉරෙක්ටස්
    - iii. පීකිං මානවයා
    - iv. හෝමෝ හැබිලස්

08. වානරයෙකු බිහිවීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,
    - i ඉතිහාසයේ විකාශනය යනුවෙනි
    - ii මානව විකාශනය යනුවෙනි
    - iii සත්ත්ව පරිණාමය යනුවෙනි
    - iv මානව පරිණාමය යනුවෙනි

09. පහත යුග අතරින් ඇටසැකිලි මත වර්ණාලේප කිරීමේ අවමංගල්‍ය චාරිත්‍රය සිදු කළ යුගය,
    - i. පුරාශිලා යුගය
    - ii. මධ්‍ය ශිලා යුගය
    - iii. නව ශිලා යුගය
    - iv. හෙලෝසීන යුගය

10. වී වගාව මුල් වරට ආරම්භ වූ රට ලෙස සැලකෙන්නේ,

i. ලංකාවයි
iii. මෙක්සිකෝවයි
ii. ඉන්දියාවයි
iv. චීනයයි

11. මහසෙන් රජතුමා විසින් ඉදිකරන ලද වැවක් වන්නේ,

i. කන්තලේ වැවයි
iii. මින්නේරිය වැවයි
ii. පදවිය වැවයි
iv. කලා වැවයි

12. බසවක්කුලම වැව ඉදිකරන ලද්දේ,

i. පණ්ඩුකාභය රජු
iii. පඩුවස්දෙව් රජු
ii. වසභ රජු
iv. මහසෙන් රජු

13. ඔපබීනියාවෙකුගේ පාෂාණීභූත සලකුණක් සොයා ගෙන ඇත්තේ කුමන රටින්ද?

i කැනඩාව
iii ජපානය
ii චීනය
iv ඉන්දියාව

14. පණ්ඩුකාභය රජතුමා විසින් තම අගනුවර ලෙස තෝරා ගනු ලැබුවේ,

i දීඝගාමයයි
iii උරුවෙල ගාමයයි
ii උපතිස්ස ගාමයයි
iv අනුරාධ ගාමයයි

15. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැන්පත් කර ඇත්තේ,

i රුවන්වැලිසෑයේ ය.
iii අභයගිරියේ ය.
ii මිරිසවැටියේ ය.
iv ථූපාරාමයේ ය.

16. සඝමිත්තෙරණි ගොඩබට වරාය වනුයේ,

i. ගෝකණ්ණ
iii. මාතොට
ii. දඹකොළපටුන
iv. ලංකාපටුන

17. ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනය ඇරඹුණේ කවුරුන්ගෙන් ද?

i. සුගලා දේවියගෙනි
iii. අරිට්ඨ කුමරුගෙනි
ii. අනුලා දේවියගෙනි
iv. ස්වර්ණපාලී කුමරියගෙනි

18. දේවානම්පියතිස්ස රජතුමා භික්ෂූන් වහන්සේලාට දානය පිරිනැමීමට ඉදිකළ ආරාමය,

i. තිස්සාරාමය නමිනි
iii. මහාවිහාරය නමිනි
ii. ලහබත්ගේ නමිනි
iv. මහබෝ ගෙය නමිනි

19. ථූපාරාමය පළමු වරට ඉදිකළේ මින් කුමන හැඩයෙන් ද?

i. ධාන්‍යාකාර
iii. ඝණ්ටාකාර
ii. බුබ්බුලාකාර
iv. ඝටාකාර

20. මිහිඳු මහ රහතන් වහන්සේ සමග පැමිණි පිරිස අතර සිටි සාමනේර හිමි නම කවුරුන්ද?

i. ඉට්ඨිය
iii. සුමන
ii. බද්දසාල
iv. උත්තිය

## II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය ඇතුලු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. පිරමීඩ නිර්මාණය සම්බන්ධ පුරාණ වැසියන් කවුරුන්ද?
ii. මේවා තුළ තැන්පත් කර ඇත්තේ මොනවාද?
iii. මෙම නිර්මාණ අයත් වන්නේ කවර ශිෂ්ටාචාරයකට ද?
iv. පුරාණ මිනිසුන් මැටියෙන් තැනූ දැකැත්තක් සොයා ගනු ලැබුවේ කුමන රටකින් ද?

(ල-2×4=8)

02. A, B, C, D යටතේ අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. දීපවංසය රචනා වූ සියවස කුමක්ද?
B. මහාවංශය ලියන ලද කතුවරයා කවුරුන්ද?
C. පොළොන්නරුවේ ගල් විහාරය ඉදිකල රජතුමා කවුද?
D. අභය වැව ඉදිකල රජතුමා නම් කරන්න. (ල-2×4=8)

03.

i. ලෝකයේ මුල්ම ජීවීන් බිහි වූ ස්ථානය නම් කරන්න. (ල-02)
ii. A - පළමුවරට ගොඩබිම පහළ වූයේ කුමන සතුන් වර්ගයද?
B - එම යුගය හැඳින් වූ නම කුමක්ද? (ල-04)
iii. හෝමෝ හැබිලිස් මානවයා පිළිබඳ වාක්‍ය 5ක් ලියා දක්වන්න. (ල-05)

04.

i. පූර්ව ශිලා යුගයේ දී මිනිසුන් ආහාර සපයා ගත් ක්‍රම දෙකක් නම් කරන්න. (ල-02)
ii. මධ්‍ය ශිලා යුගයේ ලක්ෂණ 4ක් ලියන්න. (ල-04)
iii. නව ශිලා යුගයේ දී වගා කළ ධාන්‍ය වර්ග 3ක් නම් කර ඇති කළ සත්ත්ව වර්ග දෙකක් ද නම් කරන්න. (ල-05)

05.

i. මානව පරිණාමය අනුව අප සියලු දෙනා අයත් වන්නේ කුමන මානව වර්ගයටද? (ල-02)
ii. ශ්‍රී ලංකාවේ මුල්ම ජනාවාසවල මිනිසුන් ආහාරයට ගෙන ඇති දේවල් 4ක් නම් කරන්න. (ල-04)
iii. ගල් යුගයේ මිනිසා අවමංගල්‍ය චාරිත්‍ර ඉටු කළ ආකාරය කෙටියෙන් ලියන්න. (ල-05)

06.

i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය බිහි විමට මුල් වූ ගංගා දෙක නම් කරන්න. (ල-02)
ii. චීන ශිෂ්ටාචාරයේ වැසියන් ලොවට හඳුන්වා දුන් දායාද දෙකක් නම් කරන්න. (ල-04)
iii. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ කෘෂිකර්මාන්තය පිළිබඳ වාක්‍ය 5ක් ලියන්න. (ල-05)

07.

i. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය බිහි වූ ගංගා නිම්නය නම් කරන්න. (ල-02)
ii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රධාන නගර 4ක් නම් කරන්න. (ල-04)
iii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නගර සැලැස්ම පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල-05)

08.

i. අතීතයේ දී ශ්‍රී ලංකාව හැඳින් වූ වෙනත් නම් දෙකක් ලියන්න. (ල-02)
ii. දේවානම්පියතිස්ස රජතුමාගේ රාජ්‍ය කාලයේ සිදු වූ වැදගත් සිදුවීම් දෙකක් නම් කරන්න. (ල-04)
iii. පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර නගරය නිර්මාණය කර ඇති ආකාරය පිළිබඳ කෙටියෙන් ලියන්න. (ල-05)